




සම්මානිත මහාචාර්ය
කුසුමා කරුණාරත්න

"මගේ කය වැඩුණේ අනික් සිංහල ගැමියකුගේ කය වැඩුණාක් මෙනි. සිත වැඩුණේ වෙනත් විදියකිනි. උසස් විදුහලකින් හෝ පිළිවෙළින් උගැන්මක් නොලත් මා දැනුම ලැබුවේ අත්දැකීම් හා ආසාවෙන් පොත් කියවීමෙනි. පුස්කොළ හෝඩියෙන් මට අකුරු ඉගැන්නූ ගුරුතුමා පාලිය හා සකුව තබා සිංහලයවත් හොඳින් දත්තෙක් නොවීය. ගමේ දරුවන්ට අකුරු ඉගැන්වීමෙන් ලත් අත්දැකීම ඇති තලතුනා වියෙහි වූ ඔහු හොඳ ගුරෙක් වී ය. ඔහු මගේ පමණක් නොව මගේ මවුපියන්ගේත් සහෝදරියන්ගේත් ගෞරවය දිනා ගත්තේ ඉවසීමෙන් හා සංයත සන්තෝෂයෙන් අකුරු ඉගැන්වීමෙනි." (මාර්ටින් වික්‍රමසිංහ, උපන් දා සිට, 6 පිට)

ශ්‍රී ලාංකික සමාජය තුළ මෙන්ම සිංහල සාහිත්‍ය ක්ෂේත්‍රය තුළ ද නොමැකෙන නමක් තබා ඇති අග්‍රගණ්‍ය ලේඛකයකු වන මාර්ටින් වික්‍රමසිංහ මහතා තම ජීවන තොරතුරුවලින් බිඳක් ප්‍රකාශයට පත් කරමින් රචනා කළ 'උපන් දා සිට' නම් කෘතියෙහි ඇතුළත් වන පාඨයකි, ඉහතින් දැක්වූයේ. එතුමා මෙම කෘතියෙහි සංඥාපනයෙහි මෙලෙස සඳහන් කර ඇත. "මෙය ජීවන චරිතයක් නොවේ; නවකථාවක් ද නොවේ; මතක වතක් ද නොවේ. විශේෂ සිතුම් පැතුම් ඇති ඇතැම් දරුවෝ සෙස්සන්ගෙන් වෙනස්ව කැපී පෙනෙන ක්‍රියාකාරකම්වලට නිරතුරුවම යොමු වූහ අනාගතයේදී මුළු සමාජයේම අවධානය යොමු වන අන්දමේ ශ්‍රේෂ්ඨ චරිතයක් වීමේ වාසනාව ලත් මාර්ටින් වික්‍රමසිංහ බාල වියේදී තමන් කළ කී දෑ මෙලෙස පවසද්දී සැබවින්ම අභිමානවත් බවක් එයින් මතු වෙයි.

මාර්ටින් වික්‍රමසිංහ නම් වූ සුප්‍රකට ලේඛකයා වෙතින් මතු වී පෙනෙන විද්‍යාඥයෙක් මෙන්ම දාර්ශණිකයෙක් ද අපට දැකගත හැකි වෙයි. මෙතුමා සිය බාල විය සිහිපත් කරන අතරතුරදී තමන් වෙත තිබූ ඇතැම් අඩුපාඩු ගැන මෙන්ම ඒවා හේතු කොටගෙන තමන් යොමු වූ විශේෂ ක්‍රීඩාවන් ගැන ද සඳහන් කරන අවස්ථා බොහෝය. සෙසු ගැමි දරුවන් කළ කී දෑ ඉක්මවමින් තමා වෙනස් දේ කරන්නට යොමු වූයේ තමන් තුළ තිබූ උදාසීන බව නිසා යයි ඔහු සිතයි. එසේ වුවද මෙම උදාසීනත්වය හුදෙක් ඔහු වෙත වූ දුර්වලතාවක් නම් නොවේ. ඒකාකාරී ජීවන රටාවකට ඇල්මක් නොදක්වමින් එවැනි නීරස දේ ප්‍රිය නොකිරීමට හේතුව වූයේ ඔහු සතුව තිබූ බලයත්, ඒ පරිසරයෙහි බැසගත් මුදුන් මුල ඇති ඔහුගේ චරිතය හැම ආපදාවන්ට ඔරොත්තු දෙන දැඩි ශක්තියක් ලැබූ සැටිත් ඔහු මේ පොතින් ව්‍යක්ත ලෙස නිරූපණය කරන්නේ තමා කළ පින් පව් නොසඟවා කියන මමත්වයෙන් තොර දරුවෙකු ලෙසිනි." (උපන් දා සිට)

මෙලොවට බිහිවන ශ්‍රේෂ්ඨ පුද්ගලයන් සිය ජීවිත කාලය තුළදී තමන්ගෙන් රටට, සමාජයට ඉටු විය යුතු මෙහෙවර උපරිම ශක්තියෙන් ඉටු කිරීමට හැකිය. බොහෝ විට කෙනකුගේ ජීවිතයේ මෑත සිදුවීම්වලට වඩා ඈත සිදුවීම්, එනම් ළමා වියේ කළ කී දේ වඩාත් හොඳින් මතකයේ රැඳෙයි. එවැනි තොරතුරුවලින් එම ලේඛකයාම ඉමහත් රසයක් විඳගනු ඇත. පාඨකයාට ද එහි රසය වහනය වන සේ ලිවීමට දක්ෂ කතුවරයෙක් නිතැතින්ම සමත් වෙයි. කේ. ජයතිලක මහතා සඳහන් කරන පරිදි, "ළමා වියේ අත්දැකීම් මෑත සිදුවීම්වලට

# "පවසති ඔවුහු මෙලෙසින්, අබිමන් කියමන්" 1

කුඩා වියෙහි සිට මා කළ කම්, දෙඩූ දෙඩුම්, ඇසූ විත්ති, දුටු දැකුම්, සිතූ සිතුම් හා පැතූ පැතුම් ද සිහි කරන්ටත් ලියන්ටත් කළ වෑයමෙහි විපාක ඵලයකි. 'උපන් දා සිට .......' යනු ඒ විපාක-ඵල හැඳින්වෙන සංකේතයක් මිස නමක් නොවේ. (උපන් දා සිට, සංඥාපනය)

"හැදෙන ගහ දෙපෙත්තෙන් දැනේ" යන ප්‍රකට ප්‍රස්තාව පිරුළ අර්ථවත් කරවමින් මාර්ටින් වික්‍රමසිංහ නම් වූ කුඩා දරුවා බාල වියේ සිටම විශේෂයෙන් කැපී පෙනෙන ගති ලක්ෂණ හා හැසිරීම් රටාවක් ප්‍රකට කර ඇත. සෙසු දරුවන් සමග සෙල්ලම් කිරීමේදී ඔවුන් හා සමව පොල් පිති හරකුන් දක්කාගෙන යෑම, ඉරටු කෑලි එක් කොට



නූලෙන් බැඳ සාදාගත් කරත්තයේ රෝද ලෙස සූරිය ගෙඩි සවි කිරීම, වීසි කරන ලද කුරුම්බා කෝම්බ සිදුරු කොට බිම සිටවූ රිටට සවි කොට අනික් අවශ්‍ය දෑ ද සොයා සකසාගෙන පොල්පිති සෙක්කුව සෑදීම යන මේ සියලු කටයුතුවලින් සමන්විත කොට ගැමි දරුවන් සමග හරිහරියට ක්‍රීඩා කරමින් විනෝද වීම කුඩා වික්‍රමසිංහ පළ කළ සාමාන්‍ය හැසිරීම් රටාව විය. එසේ වුවද, එයින් බැහැරව ඔහු කරන්නට යොමු වූ බොහෝ දේ ඔහුගේ විශේෂත්වය ප්‍රකට කළේය.

"කජු කඩනු පිණිස මම අනික් සමහර දරුවන් නොනගින කජු ගස්වලට නැංගෙමි. මුහුදෙහි, ගඟෙහි ඔරුවෙන් යාත්‍රා කරන්ට මම කුඩා වියෙහිදී ද බිය නොවීමි. අනික් දරුවන් පරෙස්සමෙන් පා තබමින් එගොඩට ගිය ඒදංඩ ඔස්සේ දුවන්ට මම පුරුදු වීමි." (උපන් දා සිට, 13 පිට)

වර්තමාන සමාජයේ හැදෙන වැඩෙන බොහෝ දරුවනට නොලැබෙන අන්දමේ විවිධාකාර අත්දැකීම් විඳගන්නට එකල ගැමි පරිසරයේ විසූ දරුවෝ වාසනාව ලදහ. ඒ අතුරෙන් ද විශේෂ කුසලතා හෝ කිසියම් විශේෂත්වයක් බව කිව හැකිය. මොහු සෙසු දරුවන් කළ ඇතැම් දේ එලෙසින්ම නොකළේ උදාසීන බව නිසා වුවද ඒ වෙනුවට යොමු වූ විශේෂ හැසිරීම් රටාවන් හා ක්‍රියාකාරකම් මාර්ටින් වික්‍රමසිංහ නම් වූ ශ්‍රේෂ්ඨ චරිතයකට පදනම දැමූ බව පැහැදිලිය.

ඇමෙරිකානු ලේඛක අර්නස්ට් හෙමිංවේ බාල වියේ සිටම වන සතුන් ගැන, ජලාශ්‍රිත මසුන් වර්ග ගැන, සතුන් දඩයම් කිරීම ගැන විශේෂ උනන්දුවක් දැක්වූවෙකි. පියා සමග වනයේ සැරිසරමින් එවන් දේට යොමු වීමට හෙමිංවේ බෙහෙවින් ප්‍රිය කළේය. ඇමෙරිකානු ලේඛකයන් අතර විශිෂ්ට නිර්මාණ කරුවකු බවට පත් වීමට හෙමිංවේගේ බාල වියේ මෙවන් හැසිරීම් රටාවක් හේතු වී ඇත්තා සේම මාර්ටින් වික්‍රමසිංහ සතුව තිබූ විශේෂ රුචි අරුචිකම් හා හැසිරීම් ද ඔහු ශ්‍රී ලාංකික සමාජය තුළ විශිෂ්ටත්වයට පත් වීමට පදනම දැමූ බව සිතිය හැකිය.

ඉහත දැක්වූ පරිදි මාර්ටින් වික්‍රමසිංහ සිය ළමා වියේදී සාමාන්‍ය ගැමි දරුවන් හා සමව ක්‍රීඩා කළත්, ඔහු තුළ වැඩෙමින් සිටි විශේෂ පුද්ගලයා සෙසු දරුවන් අබිබවා ඉහළට නැගී ආවේය. පොතපත බහුල වශයෙන් මුද්‍රණය නොවුණ සමයක අතට හසු වූ බොහෝ අගනා පොත් කියවා දැනුම ලබාගැනීමටත් විචාරාක්ෂියෙන් යුතුව කරුණු, මෙනෙහි කිරීමටත් මොහු යොමු වීය. වර්තමානයේ සිංහල බස උගන්නා පාසල් සිසුන්ගේ හෝ ඉහළ අධ්‍යපනය ලබන විද්‍යාර්ථීන්ගේ වුව වැඩි අවධානයකට ලක් නොවන සිදත් සඟරාව වැනි පොතපත තරුණ වික්‍රමසිංහගේ විශේෂ අවධානයට ලක් වීම අනාගතයේ සාර්ථක ලේඛකයකු හා විද්වතකු බවට පත් වීමේ භාග්‍යය ඔහුට උදා කරවීය. බස පිළිබඳ මූලික දැනුමෙන් පෝෂණය වූ මෙම තරුණයාගේ අනාගත අභිවෘද්ධිය සැලසීමට හේතු වූ විශේෂ කරුණු අතර උගතුන් ඇසුර, ගුරුවරුන්ට කීකරුව ඉගෙනීම හා දැනුම ලබාගැනීම මෙන්ම හොඳ අවබෝධයකින් යුතුව ලේඛන කාර්යයෙහි නිරත වීම ද පැහැදිලිවම දැකගත හැකිය.

ආගම, විද්‍යාව, භාෂා ශාස්ත්‍ර, පැරණි පොතපත ආදිය කියවීම සමගම උසස් බුද්ධිමතුන්ගේ ඇසුර ද වික්‍රමසිංහ මහතා ප්‍රිය කළ දේ විය. පුවත්පත් කලාවට යොමු වූ පසුව ද ඒ සියලු විෂයයන් කෙරෙහි මෙන්ම ප්‍රභූ ඇසුර ද මෙතුමාට නොමඳව ලැබිණ. අනාගතය සරුසාර කරගැන්ම සඳහා කවර පුද්ගලයකුට වුවද බාල වියේ සිටම, උගතුන්ගේ ඇසුර, බුද්ධිමතුන්ගේ මතු නොව යහපත්, ශ්‍රේෂ්ඨ පුද්ගලයන්ගේ ඇසුර සැබවින්ම ප්‍රබල හේතුවක් වනු ඇත. මාර්ටින් වික්‍රමසිංහ මහතා සිය බාල විය කෙරෙහි ලබාගත් විශේෂ බලපෑම මෙන්ම අනුග්‍රහය වූයේ ද, එකල සිටි යහපත් ගුරුවරුන් මෙන්ම සිය විමර්ශනාත්මක දෘෂ්ටියයි. 'උපන් දා සිට' කෘතිය පිළිබඳව එහි පසු පිටෙහි යොදා ඇති සටහන කියවා බලන්නකුට වුවද, මෙම ශ්‍රේෂ්ඨ චරිතය මුල සිටම සැකසුණ ආකාරය පිළිබඳව තව දුරටත් අවබෝධයක් ලබාගත හැකිය.

"ගැමි පරිසරය වික්‍රමසිංහ කෙරෙහි පැවැත් වූ උත්සාහ දරන බවත් යම් විටෙක ඒ ගැන සමාජයට ඉඟියක් දෙන්නට තමන් අතින් ලියවෙන ජීවන තොරතුරු මගින් පවසන වදන් සැබවින්ම අබිමන් කියමන් බවත් මාර්ටින් වික්‍රමසිංහ චරිතය හා ඒ ගැන තොරතුරු බිඳක් පළ කරන 'උපන් දා සිට' කෘතිය මගින් ප්‍රතීයමාන වෙයි.

*"මිනිසෙකුට කියවීමට ඇති විශිෂ්ටතම ග්‍රන්ථය, තම අතීත මතක සටහන්ය. එම පොතේ හැම ඡේදයක්ම ඔහුට ආස්වාදජනකය. එසේම අර්ථාන්විතය."*
*- කේ. ජයතිලක,*

"මිනිසෙකුට කියවීමට ඇති විශිෂ්ටතම ග්‍රන්ථය, තම අතීත මතක සටහන්ය. එම පොතේ හැම ඡේදයක්ම ඔහුට ආස්වාදජනකය. එසේම අර්ථාන්විතය." (කේ. ජයතිලක, පුංචි පැලේ ගස වෙනා, 6 පිට)

උක්ත පාඨයෙන් කියවෙන පරිදි විශිෂ්ට ලේඛකයකු අතින් ලියවෙන ග්‍රන්ථ අතර අගනා ග්‍රන්ථයක් ලෙස ඔහුගේ ජීවන තොරතුරු ඇතුළත් වන කෘතිය සැලකිය හැකිය. ශ්‍රී ලාංකික සමාජය තුළ ජීවත් වූ, එමෙන්ම සාහිත්‍ය ලෝකයේ විශිෂ්ටත්වයක් හිමි කරගත් ලේඛකයකු වන කේ. ජයතිලක මහතා තම ජීවන තොරතුරු, පනස් වසරක මතක සටහන් ලෙසින් ග්‍රන්ථයකට සම්පාදනය කොට ඉදිරිපත් කළේ "පුංචි පැලේ ගස වෙනා" යන නමිනි. එහි



ආරම්භයට යොදා ඇති ඉහත දැක්වූ ඡේද ඛණ්ඩය මගින් පළ කෙරෙනුයේ ද මිනිසකුට සිය අතීත මතක සටහන් ලියා ප්‍රකාශයට පත් කළ හැකි නම් එය ඔහුගේ විශිෂ්ටතම ග්‍රන්ථය ලෙස සැලකිය හැකි බවයි.

කවර පුද්ගලයකු වුව තම ජීවිතය හා සම්බන්ධ අතීත සිදුවීම් යළි යළිත් සිහි කරන්නට කැමති වනු ඇත. බොහෝ විට තමන් හට සිදු වූ වාසනාවන්ත දේ පමණක් නොව අවාසනාවන්ත දේ පවා මෙනෙහි කරමින් කිසියම් වින්දනයක් ලැබීමට ඔවුන් යොමු වන්නට ඉඩ ඇත. එපමණක් නොව, කවර ක්ෂේත්‍රයක හෝ ශ්‍රේෂ්ඨ යයි සැලකිය හැකි ලේඛකයකු හෝ ලේඛිකාවක් තමන් ගෙවා ඇති ජීවිතයේ මං සලකුණු පිළිබඳව කිසියම් අභිමානයකින් යුතුව පවසන ආකාරය ද දැකගත වඩා තදින් සිතට කා වැදී තිබීම" ඔහුගේ මෙම කෘතිය මගින් ද ඔප්පු වී ඇත. කතුවරයා දක්වන පරිදි ඔහු මෙන්ම අන් කවරකු වුවද වැඩි වශයෙන් ආශාවක්, පෞද්ගලික ආස්වාදයක් විඳගන්නේ එවැනි ළමා වියේ අත්දැකීම් යළි සිහිපත් කරමින් ඒවා ග්‍රන්ථාරූඪ කිරීමෙනි.

තමන් විසින් රචිත නිර්මාණ හා වෙනත් කෘතීන්ට සමාජය වෙතින් යහපත් වූත් අයහපත් වූත් ප්‍රතිචාර හා විවේචන එල්ල වූ අයුරු ගැන ජයතිලක මහතා නිර්භයවම තම කෘතියෙහි සඳහන් කර ඇත. එවැනි තොරතුරු අභිභවා මෙහි මතු වී පෙනෙන අභිමානවත් අදහස් පාඨකයාගේ වැඩි අවධානයට ලක් වූ බවට සැකයක් නැත.

"රාජ මාර්ගයක මංගල රථයකින් ගමන් කරන තැනැත්තෙකුට කොතරම් දුරක් ගමන් කළේ වී නමුත් ලෝක ස්වභාවය එතරම් හොඳින් දැන හැඳින නිවී සැනසිල්ලේ ඔහුගේ ආදර සංග්‍රහ විඳිය හැකි නොවේ. ප්‍රතිභාව නමැති කෙක්කත්, ස්මරණය නමැති ගමන් මල්ලත්, ධෛර්යයත් ඇත්නම් වන දුර්ග, ගිරි දුර්ග, ජල දුර්ග ඔස්සේ ගමන් කරමින් එකතු කරගත හැකි අත්දැකීම් නමැති පලවැල ප්‍රමාණයෙන් විවිධ රසාලිප්තයන් තනා ජනතාවට පිළිගන්වන්නේ මේ අත්දැකීම් උපයෝගී කරගෙනය." (පුංචි පැලේ ගස වෙනා, 13, 14 පිටු)

ජයතිලක මහතා තම ජීවන ගමනෙහිදී සමාජය වෙත දායාද කළ අගනා නිර්මාණවලින් පාඨක රසාස්වාදය දැනවූ අයුරු පිළිබඳව මෙම කෘතිය කියවන්නකුට සිහියට නගාගැනීම අසීරු නොවේ. ප්‍රතිභාව, ස්මරණය හා ධෛර්යය සමග සිය ලේඛන කාර්යයෙහිදී මෙන්ම පොදුවේ ජීවන ගමනෙහිදී ද තමන් ඉදිරියට පා නැගූ ආකාරය ජයතිලක මහතා සිහියට නගාගන්නේ ප්‍රමාණවත් තරම් අභිමානයකින් ද යුතුවය. තමන් සතු ඥානය මෙන්ම අත්දැකීම් ද ප්‍රකට කරවමින්, මෙම ග්‍රන්ථයෙහි අවසානයට යෙදූ පරිශිෂ්ටය තුළ ඔහු පවසන මතු දැක්වෙන වදන් එම අභිමානවත් බව තව දුරටත් ප්‍රකට කරවයි.

"ලෝකයට, විශේෂයෙන් අප ජීවත් වන මේ කුඩා රට වූ ලංකාවට, කුමක් වෙමින් පවතින්නේදැයි මම නොයෙක් අවස්ථාවල තනිවම කල්පනා කරමි. මම ජීවිතයේ කවරදාකවත් සර්ව අශුභවාදියෙක් නොවීමි. තදබල කලකිරීමක් ඇති වූ විටක පවා අශුභවාදී ප්‍රාවරණයට යටින් ශුභවාදී අයෝමය අස්ථි පංජරයක් මා තුළ විය." (පුංචි පැලේ ගස වෙනා, 335 පිට)

ළබන කලාපය හා බැඳෙයි